# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/68 – 2022 මාර්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා – 2022.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 85 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2020/HW/234.
ප්‍රා. ලේ.ගේ යොමු අංකය: DSO/HOM/LAC/135.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 10 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, හෝමාගම.

II. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 483 ගොඩගම උතුර, 483 ඒ ගොඩගම ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, ගොඩගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක CO/HMG/2021/114 සහ 2021.11.24 දිනැති පූගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' - හයිලෙවල් පාර- ප්‍රමාණයඃ හෙක්. 0.0008**
උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, හයිලෙවල් පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අංක බී සහ හයිලෙවල් පාර; දකුණට: හයිලෙවල් පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

02. **කැබලි අක්ෂර 'බී' - හයිලෙවල් පාර - ප්‍රමාණයඃ හෙක්. 0.0015**
උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, හයිලෙවල් පාරේ වරිපනම් අංක 64 1/6 දරන ඉඩම සහ කැබලි අංක සී; නැගෙනහිරට: කැබලි අංක සී සහ හයිලෙවල් පාර; දකුණට: හයිලෙවල් පාර


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ, හයිලෙවල් පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි එස්. එල්. එම්. ඩී. ලලිත් ප්‍රසන්න හිමිකම් කියන ඉඩම් සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

03. **කැබලි අක්ෂර 'සී' - වරි. අංක 64 1/6 හයිලෙවල් පාර - ප්‍රමාණයඃ හෙක්. 0.0016**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ හයිලෙවල් පාරේ වරිපනම් අංක 645 දරන ඉඩම; නැගෙනහිරට: හයිලෙවල් පාරේ වරිපනම් අංක 645 දරන ඉඩම සහ හයිලෙවල් පාර; දකුණට: හයිලෙවල් පාර සහ කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී, හයිලෙවල් පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

04. **කැබලි අක්ෂර 'ඩී' - හයිලෙවල් පාර - ප්‍රමාණයඃ හෙක්. 0.0067**

උතුරට: හයිලෙවල් පාරේ වරිපනම් අංක 514 දරන ඉඩම; නැගෙනහිරට: හයිලෙවල් පාරේ වරිපනම් අංක 514 දරන ඉඩම සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ හයිලෙවල් පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි රජය හිමිකම් කියන ඉඩම; බටහිරට: හයිලෙවල් පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි රජය හිමිකම් කියන ඉඩම සහ හයිලෙවල් පාර.

EOG 03 - 1085